---

**රජගම ප්‍රාදේශීය සභාව**

**ගාල්ල දිස්ත්‍රික්කය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 අප්‍රේල් 22 දින ද ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2012 මැයි 21 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 නොවැම්බර් 20 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

### 1.2 මතය

මාගේ වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතු කොටගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති රජගම ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට මට නොහැකිය.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

සභාව විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන සමග හෙළිදරව් කර නොතිබුණි.

#### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.ෟ

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වූ රු.136,104 ක අවිනිශ්චිත ගිණුම් බැර ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ප්‍රධාන ලෙජරයේ ගිණුම්වල දැක්වෙන ශේෂයන් හා මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ශේෂයන් අතර රු.569,513 ක වෙනසක් විය.

(ඇ) රු.67,681 ක් වටිනාකම වූ පුස්තකාල පොත් සමාලෝචිත වර්ෂය තුළදී අපහරණය කර තිබුණ ද, එකී පොත්වල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලින් ඉවත් කර නොතිබුණි.

(ඈ) වැය විෂයයන් 12 ක් සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ණයහිමි ප්‍රතිපාදනය රු. 2,508,391 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල රු. 937,397 ක් ලෙස දක්වා තිබීමෙන් සමාලෝචිත වර්ෂයේ වියදම හා ණයහිමියන් රු. 1,570,994 කින් අඩුවෙන් දක්වා තිබුණි.

**1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම**

**(අ) පිළිතුරු නොලත් විගණන විමසුම්**

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිට විගණන විමසුම් 06 කට පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. එකී විමසුම්වලට භාජනය වූ ගනුදෙනුවල ගණනය කළහැකි වටිනාකම රු.15,239,807 ක් විය.

**(ආ) තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම**

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.78,254,253 ක් වූ ගනුදෙනු විගණනයේ දී සතුටුදායක ලෙස සංනිරීක්ෂණය කිරීමට නොහැකි විය.

**2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.15,806,684 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.3,129,554 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.000' | රු.000' | රු.000' |
| (i) | වරිපනම් හා බදු | 560 | 1,160 | 10,126 |
| (ii) | බදු කුලී | 1,350 | 1,242 | 616 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 410 | 393 | 204 |
| (iv) | වෙනත් ආදායම් | 40,405 | 53,285 | 25,234 |

### 2.2.2 හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂවල අයකර ගතයුතු රු.10,125,875 ක් වූ වරිපනම් බදු, රු.616,476 ක් වූ බදුකුලී සහ රු.204,353 ක් වූ වෙළඳ බලපත්‍ර ගාස්තු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 සහ 159 වගන්ති ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i) | උසාවි දඩ | 3,194,499 |
| (ii) | මුද්දර ගාස්තු | 16,672,146 |

### 2.2.4 දුරකථන / විදුලි සංදේශ කුළුණු

නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්ගේ 2008 දෙසැම්බර් 16 දිනැති අංක:5/02/1/384 දරන චක්‍රලේඛයේ 7(v) වගන්තියට අනුව දඩ අයකළ යුතු බව දක්වා තිබුණ ද, සහා බලප්‍රදේශ සීමාවේ ඉදිකර, භාවිතයට ගන්නා කුළුණු 04 ක් සඳහා අනුකූලතා ගාස්තු ලෙස රු.22,000 ක් හා දඩ වශයෙන් රු.225,700 ක් අයකර නොතිබුණි.

### 2.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ)** 1988 අංක 74 දරන පනතින් සංශෝධිත 1975 අංක 01 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනතේ අවශ්‍යතාවයන් අනුව සභාවේ සභාපති, උප සභාපති ඇතුළු මන්ත්‍රීවරුන් 14 දෙනාම විගණන දිනය වූ 2013 අගෝස්තු 16 දින දක්වා 2012 වර්ෂයට අදාළ වත්කම් හා බැරකම් ප්‍රකාශ ලබා දී නොතිබුණි.

**(ආ)** මීටියාගොඩකන්ද ඉඩම වෙන්දේසි කිරීමේදි පොදු කටයුතු වෙනුවෙන් වෙන්කර ඇති පර්චස් 27.5 ක් වූ අංක 12 දරන ඉඩම් කැබැල්ල ඔප්පුවකින් සභාවට පවරා නොතිබුණි.

**(ඇ)** 2006 අප්‍රේල් 10 දිනැති අංක 28 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය අනුව ස්ථිර/ තාවකාලික /අනියම්/ආදේශක/කොන්ත්‍රාත් හෝ වෙනත් කිසියම් පදනමක් මත බඳවා ගැනීම් කරනු ලබන්නේ නම් ඒ සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතිය ලබා ගතයුතු වුවද, එසේ අනුමැතිය ලබා නොගෙන සභාව විසින් ආදේශක හා අනියම් සේවකයින් 35 දෙනෙකු බඳවා ගෙන සේවයේ යොදවා 2012 වර්ෂය තුළදී රු.6,306,882 ක් වැටුප් හා දීමනා වශයෙන් සභා අරමුදලින් ගෙවා තිබුණි.

**(ඈ)** ඉකුත් වර්ෂ දෙක තුළදී සහ සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා 10 කදී සභාවේ නිලධාරීන් වෙත රු.1,109,500 ක අත්තිකාරම් ලබා දී තිබුණ ද, විගණන දිනය වූ 2013 අගෝස්තු 16 දින දක්වාම එම අත්තිකාරම් පියවා නොතිබුණි.

**(ඉ)** වර්ෂ 06 කට වැඩි කාලයක සිට අයවීම් හිඟහිටව පැවති සේවක ණය අත්තිකාරම් ශේෂය රු.26,760 ක් විය.

**(ඊ)** අකුරල උප කාර්යාලයීය ආයුර්වේද බෙහෙත් ශාලාව රෝගීන් සඳහා ප්‍රතිකාර කිරීමකින් තොරව පවත්වාගෙන යන බව 2013 අගෝස්තු 16 දින සිදුකළ ස්ථානීය පරීක්ෂාවේ දී නිරීක්ෂණය විය. එමෙන්ම බෙහෙත් තොගයෙන් කොටසක් ආයුර්වේද බෙහෙත් ශාලාවට යාබදව ඇති සභාපතිවරයා සඳහා වෙන් කරන ලද කාමරය තුළ ගොඩගසා තිබුණි. එසේ වුවද, ආයුර්වේද වෛද්‍යවරියට 2012 සැප්තැම්බර් 08 සිට විගණන දිනය වූ 2013 අගෝස්තු 16 දින දක්වා වැටුප් ලෙස මෙම කාලසීමාව තුළ රු.457,882 ක් සභා අරමුදලින් ගෙවා තිබුණි.

(උ) 2010 මාර්තු 10 දිනැති හා අංක PF/R/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් වරයාගේ ලිපිය ප්‍රකාරව අවම වශයෙන් වර්ෂ 03 ක් සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබූ අතර සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්මක් ද පිළියෙල කර නොතිබුණි.

## 2.4 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන අංශයක් ආයතනයේ පිහිටුවා නොතිබුණු අතර, ආයතනය තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් ද සිදුකර නොතිබූ අතර 2006 අගෝස්තු 28 දිනැති හා අංක:PE/F/S/4(xiii) දරන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා නොතිබුණි.

## 3. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) වත්කම් කළමනාකරණය